# ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් වතුපිටිවල ඇඟලුම් කලාපය ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***ඩබ්.කේ.ඒ.පි.කුමාරි[1]***
***ප්‍රියන්ත මුදලිගේ[2]***

---

සංක්ෂේපය

ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් වේ. ඒ තුළ ස්ත්‍රි, පුරුෂ අයිතිවාසිකම් තහවුරු වී ඇත. ප්‍රජාතන්ත්‍රවාදය මත පාලනය වන ලංකාවට 1977 දි විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දිමත් සමඟ ආර්ථික ක්ෂේත්‍රයේ විශාල වෙනස්කම් සිදු වි ඇත. එත් සමඟ ආර්ථික ක්ෂේත්‍රයට කාන්තාවන්ගේ දායකත්වය විශාල වශයෙන් ඉහල ගොස් ඇත. එතුළ ප්‍රධාන වශයෙන් ඇඟලුම් ක්ෂේත්‍රය මුලික වි ඇත.ආර්ථික සංවර්ධනයට කාන්තා දායකත්වය ඉහළ ගියද කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා විම අතින් පහළ බැස ඇත. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම් මොනවාද,ඇඟලුම් සේවිකාවන්ට හිමිවිය යුතු අයිතින් මොනවා ද, කාන්තා අයිතිවාසිකම් කොතෙක් දුරට ආරක්ෂාවී තිබේ ද යන්න සොයා බැලිම වේ. අධ්‍යයන ප්‍රදේශය ලෙස ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රදේශිය ලේකම් කොට්ඨාසයේ වතුපිටිවල ඇඟලුම් කලාපය තොරාගත් අතර ප්‍රශ්නාවලියක් හා සම්මුඛ සාකච්ඡා භාවිත කරමින් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී. එහි දී සේවිකවන් 80 දෙනෙකු නියදිය ලෙස තොරාගෙන ලබා ගන්නා ප්‍රථමික දත්ත සරල සංඛ්‍යානමය විධි ක්‍රම භාවිත කරමින් හා ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදය භාවිත කරමින් විශ්ලේෂණය සිදු කර ඇත. මෙහි ප්‍රධාන අධ්‍යයන ප්‍රතිඵලය ලෙස ඇඟලුම් ක්ෂේත්‍රය තුළ හා ශ්‍රී ලංකාව තුළ කාන්තා අයිතිවාසිකම් කඩවි ඇති බව පැහැදිලි වේ. ඇඟලුම් සේවිකාවන්ගේ අයිතිවාසිකම් කඩවිම සඳහා සේවිකාවන්ගේ නොදැනුවත්කම ,නිළධාරින්ගේ නොසැලකිලිමත් භාවය හා පවතින නිතීවල දුර්වලතාවන් බලපා ඇති බව පැහැදිලි විය. අධ්‍යයන සමීක්ෂණය අනුව කාන්තාවන් ඇඟලුම් ක්ෂේත්‍රය තුල පිඩාවන්ට හා දුෂ්කරතාවන්ට මුහුණ දෙන බවත් වෙනත් රැකියාවක් නොමැතිකම හේතුවෙන් මෙම රැකියාව කරන බවත් පැහැදිලි විය. පිඩවන් හා දුෂ්කරතාවන් සිදු වුවත් ඒවා රැකියාව අහිමිවේ යන බිය හේතුවෙන් ඉවසා සිටිමට සේවිකාවන්ට සිදු වි ඇත. මෙම තත්ත්වය මත රාජ්‍ය හා පෞද්ගලික ආයතන මැදිහත් වි සේවිකාවන්ගේ අයිතිවාසිකම් අරක්‍ෂා කිරිමට විධිමත් නිතී හඳුන්වාදිම හා පවතින නිතී බලාත්මක කිරිමත්, ඔවුන්ගේ සුභ සාධනය සදහා වැඩසටහන් ආරම්භ කිරිමත්, උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට නිලධාරින් දැන්වත් කිරිමට පියවර ගැනිම ද වැදගත් වේ. එවිට ඇඟලුම් සේවිකාවන් මුහුණදෙන අයිතිවාසිකම් සම්බන්ධ ගැටලු විසඳාගත හැකි වේ.

ප්‍රමුඛ පදඃ අයිතිවාසිකම්, ඇඟලුම් ක්ෂේත්‍රය

---

*1. දේශපාලන විද්‍යාව, ආර්ථිකවිද්‍යාව, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ආධුනික කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*